(නවවැනි පාර්ලිමේන්තුව - සිව්වැනි සභාවාරය)

අංක 1(4).]

# පාර්ලිමේන්තුවේ අංක 1 දරන
# න්‍යාය පුස්තකය හා සම්බන්ධ පරිපූරකය

**නිකුත් කළේ 2023 මාර්තු 03 සිකුරාදා**

---

**2023 මාර්තු 21 අඟහරුවාදා**

## වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

1538/2023

ගරු රාජිකා වික්‍රමසිංහ මහත්මිය,— කෘෂිකර්ම අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවේ එළවළු හා පලතුරු නිෂ්පාදනය වාර්ෂිකව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) ප්‍රවාහනය කිරීමේදී එම නිෂ්පාදනයෙන් විනාශ වන එළවළු හා පලතුරු ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) ප්‍රවාහනය කිරීමේදී එළවළු හා පලතුරුවලට සිදු වන හානි වළක්වා ගැනීම සඳහා විධිමත් ක්‍රමවේදයක් සකස් කර තිබේද;

(iv) එසේ නම්, එම ක්‍රමවේදය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1574/2023

ගරු සංජීව එදිරිමාන්න මහතා,— කෘෂිකර්ම අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) හෙක්ටර් කොබ්බෑකඩුව ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය ආරම්භ කරන ලද වර්ෂය කවරේද;

(ii) එම ආයතනය ආරම්භ කිරීමේ අරමුණු හා එහි කාර්ය භාරය එම ආයතනය විසින් මේ වනවිට ඉටු කරනු ලබන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) වර්ෂ 2015 සිට මේ දක්වා පර්යේෂණ කටයුතු වෙනුවෙන් එම ආයතනයට වෙන් කරන ලද මුදල එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එම ආයතනය විසින් නිකුත් කරනු ලබන වාර්තා සැලකිල්ලට ගෙන කෘෂිකර්මාන්තයට අදාළ ඉදිරි සැලසුම් සකස් කරන්නේද;

(iii) අනාගත කෘෂිකාර්මික අභියෝග ජය ගැනීම සඳහා එම ආයතනය විසින් පර්යේෂණ කටයුතු සිදු කර ඊට අදාළ වාර්තා ලබා දී තිබේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1614/2023

ගරු තිස්ස අත්තනායක මහතා,— පරිසර අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මහනුවර නගරයේ, අහිතකර වායු සංයුතිය, සම්මත සාන්ද්‍රණයන්ට වඩා ඉහළ අගයක් ගන්නා බව පර්යේෂණ වාර්තාවලින් තහවුරු වී ඇති බවත්;

(ii) ඒ සම්බන්ධයෙන් 2017 වර්ෂයේදී, අදාළ සියලු පාර්ශ්වයන්ගේ සහභාගිත්වයෙන් වායු සම්පත් කළමනාකරණ වැඩසටහන් ආරම්භ කරන ලද බවත්;

(iii) පසුව එම වැඩසටහන් ක්‍රියාත්මක කිරීම නවතා දමා ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) ඉහත වැඩසටහන් ක්‍රියාත්මක නොකිරීමට හේතු කවරේද;

(ii) එම වැඩසටහන් නැවත ක්‍රියාත්මක කිරීමට කටයුතු කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1629/2023

ගරු උපුල් මහේන්ද්‍ර රාජපක්ෂ මහතා,— වැවිලි කර්මාන්ත අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවේ අන්නාසි වගාකරුවන්ගෙන් වැඩි ප්‍රමාණයක් ගම්පහ දිස්ත්‍රික්කයේ සිටින බවත්;

(ii) අන්නාසි අපනයනය කිරීමෙන් සැලකිය යුතු විදේශ විනිමය ප්‍රමාණයක් උපයා ගනු ලබන බවත්;

එතුමා පිළිගන්නෙහිද?

(ආ) (i) ශ්‍රී ලංකාවේ අන්නාසි සඳහා ජාත්‍යන්තර වෙළඳපොළ හිමි ස්ථානය කවරේද;

(ii) අන්නාසි වගාකරුවන් දිරිගැන්වීම සඳහා ගනු ලබන පියවර කවරේද;

(iii) අන්නාසි වගාව ව්‍යාප්ත කිරීම සඳහා ගනු ලබන පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1631/2023

ගරු ගුණතිලක රාජපක්ෂ මහතා,— වනජීවී හා වන සම්පත් සංරක්ෂණ අමාත්‍යතුමියගෙන් ඇසීමට,— (1)

(අ) (i) වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව සතු ඉඩම් ප්‍රමාණය අක්කරවලින් කොපමණද;

(ii) එම ඉඩම් අතරින් ඉඩම් විශාල ප්‍රමාණයක් අනවසරයෙන් අත්පත්කර ගෙන ඇති බව දන්නේද;

(iii) එසේ අනවසරයෙන් අත්පත්කර ගෙන ඇති ඉඩම් ප්‍රමාණය හෙක්ටයාර්වලින් කොපමණද;

(iv) එම ඉඩම්, නැවත වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ සන්තකයට ලබා ගැනීම සඳහා ගෙන ඇති පියවර කවරේද;

යන්න එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1633/2023

ගරු මුදිතා ප්‍රිශාන්ති මහත්මිය,— ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) දිවයිනේ මාර්ග කි.මී. 100,000ක් කාපට් කිරීමේ වැඩසටහන යටතේ මේ වනවිට කාපට් අතුරා ඇති මාර්ගවල දිග;

(ii) ඉහත වැඩසටහන යටතේ රත්නපුර දිස්ත්‍රික්කයේ වැඩ ආරම්භ කර ඇති මාර්ගවල දිග;

(iii) ඒ අතරින් මේ වනවිට වැඩ අවසන් කර ඇති මාර්ගවල දිග;

කිලෝමීටර්වලින් කොපමණද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ගොඩකවෙල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ගොඩකවෙල සිට බිබිලේගම දක්වා මාර්ගයේ කිලෝමීටර් 5ක් කාපට් අතුරා සංවර්ධනය කිරීමේ වැඩ කටයුතු මේ වනවිට නතර කර ඇති බවත්;

(ii) ඒ හේතුවෙන් එම ප්‍රදේශයේ ජනතාව දුෂ්කරතා රාශියකට මුහුණ දෙන බවත්;

එතුමා දන්නෙහිද?

(ඇ) (i) ඉහත සඳහන් මාර්ගයේ වැඩ ආරම්භ කරන ලද දිනය කවරේද;

(ii) කොන්ත්‍රාත් ගිවිසුම අනුව වැඩ අවසන් කිරීමට නියමිත දිනය කවරේද;

(iii) එම මාර්ගයේ සංවර්ධන කටයුතු නැවත ආරම්භ කරන්නේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

1634/2023

ගරු මිලාන් ජයතිලක මහතා,— මහජන ආරක්ෂක අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවේ ලියාපදිංචි කර ඇති රාජ්‍ය නොවන සංවිධාන සංඛ්‍යාව;

(ii) ඒ අතරින් මේ වනවිට ක්‍රියාත්මක තත්ත්වයේ පවතින රාජ්‍ය නොවන සංවිධාන සංඛ්‍යාව;

(iii) අලුතින් ලියාපදිංචි කිරීම සඳහා ඉල්ලුම් කර ඇති රාජ්‍ය නොවන සංවිධාන සංඛ්‍යාව;

කොපමණද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ශ්‍රී ලංකාවේ ලියාපදිංචි කර ඇති රාජ්‍ය නොවන සංවිධාන විසින් වාර්ෂිකව ගිණුම් වාර්තා ලබා දී තිබේද;

(ii) නොඑසේ නම්, ඒ සම්බන්ධයෙන් ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1673/2023

ගරු චාල්ස් නිර්මලනාදන් මහතා,— විදේශ කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවේ පැවැති යුදමය තත්ත්වය හේතුවෙන් උතුරු හා නැගෙනහිර පළාත්වල ජීවත් වූ දමිළ ජනතාව දහස් ගණනක් ඉන්දියාවට සංක්‍රමණය වී එහි කඳවුරු තුළ හා පිටත රැඳී සිටින බවත්;

(ii) මේ වනවිට යුදමය තත්ත්වය අවසන් වී ඇතත්, ඉහත පිරිසෙන් ආසන්න වශයෙන් 100,000ක පමණ පිරිසක් නැවත ශ්‍රී ලංකාවට පැමිණීමට නොහැකිව සිටින බවත්;

(iii) ඉහත සඳහන් ජනතාව අතරින් කඳවුරුවලින් පිටත ස්ථානවල ජීවත්වන බොහෝ පිරිසකට ඉන්දීය රජය විසින් වීසා බලපත්‍ර ලබා නොදීම හේතුවෙන් ඔවුන් ශ්‍රී ලංකාවට නැවත පැමිණීමේදී ඉන්දියාවේ ජීවත් වූ මුළු කාලය සඳහාම වීසා බලපත්‍ර ගාස්තු ගෙවීමට සිදු වී ඇති බවත්;

එතුමා දන්නේද?

(ආ) ඉහත සඳහන් ජනතාව නැවත ශ්‍රී ලංකාවට ගෙන්වා ගැනීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1754/2023

ගරු සමන්ප්‍රිය හේරත් මහතා,— වැවිලි කර්මාන්ත අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවට වාර්ෂිකව ආනයනය කරනු ලබන ප්ලාස්ටික් කොසු, ප්ලාස්ටික් ඉදල් හා පිරිසිදු කිරීමට යොදා ගනු ලබන ප්ලාස්ටික් බුරුසු ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) ඒවා ආනයනය කිරීම සඳහා වාර්ෂිකව වැය කරනු ලබන මුදල කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) කොහු ආශ්‍රිත භාණ්ඩ භාවිතය දිරිගැන්වීම හා ප්‍රවර්ධනය කිරීම සඳහා මේ වනවිට ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේද;

(ii) කොහු ආශ්‍රිත භාණ්ඩ සඳහා වන ආදේශක භාණ්ඩ ආනයනය අධෛර්යමත් කිරීමට ප්‍රතිපත්තිමය තීරණයක් ගෙන තිබේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1796/2023

ගරු ඉම්තියාස් බාකීර් මාකර් මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලයට උපකුලපතිවරයෙකු තෝරා ගැනීම සඳහා 2020 වර්ෂයේදී අයදුම්පත් කැඳවා තිබුණේද;

(ii) එසේ නම්, එම එක් එක් අයදුම්කරුගේ නම හා සුදුසුකම් වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) එම අයදුම්කරුවන් අතරින් සුදුසු පුද්ගලයෙකු තෝරා ගැනීම සඳහා ඇගයීම් කමිටුවක් පත් කරන ලද්දේද;

(ii) එම ඇගයීම කමිටුවේ සාමාජිකයන්ගේ නම් කවරේද;

(iii) එම ඇගයීම් කමිටුව රැස් වූ දින කවරේද;

(iv) එම ඇගයීම කමිටුව විසින් ඉහත සඳහන් එක් එක් අයදුම්කරුට ලබා දෙන ලද ලකුණු සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) මෙම තනතුර සඳහා සුදුසු පුද්ගලයකු තෝරා ගැනීම වෙනුවෙන් විශේෂ පාලක සභා රැස්වීම් පැවැත්වූයේද;

(ii) එසේ නම්, එම එක් එක් රැස්වීම පවත්වන ලද දිනය සහ ඊට සහභාගී වූ සාමාජිකයන්ගේ නම් වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) එම පාලක සභාව විසින් එක් එක් අයැදුම්කරුට ලබා දෙන ලද ලකුණු සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න තවදුරටත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

---

# යෝජනා පිළිබඳ දැනුම්දීම සහ දිනට නියමිත කටයුතු

*

මුදල්, ආර්ථික ස්ථායිකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යතුමා,— විසර්ජන පනත යටතේ යෝජනා සම්මතය (අංක 1),— 2021 අංක 30 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තිය යටතේ මුදල්, ආර්ථික ස්ථායිකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යවරයාට පැවරුන බලතල අනුව, ආණ්ඩුවේ අනුමතිය ඇතිව, මුදල්, ආර්ථික ස්ථායිකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යවරයා විසින් සාදන ලද පහත දැක්වෙන අංක 31 දරන නියමය අනුමත කළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා සම්මත කරයි:—

## 2021 අංක 30 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තිය යටතේ අංක 31 දරන නියමය

මුදල්, ආර්ථික ස්ථායිකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍ය, රනිල් වික්‍රමසිංහ වන මම 2021 අංක 30 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තියෙන් මා වෙත පවරනු ලැබ ඇති බලතල ප්‍රකාරව, ආණ්ඩුවේ අනුමතිය ඇතිව එකී පනතේ තෙවන උපලේඛනයේ විෂය අංක 21302 "පොත් මුද්‍රණය, ප්‍රචාරණය හා අලෙවිය අත්තිකාරම් ගිණුම - අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව" වෙත පැවරී ඇති කාර්යය වෙනුවෙන් නිශ්චිතව දක්වා ඇති සීමාවන්, මෙම නියමය මඟින් සංශෝධනය කරමි.

| | අයිතමය | සංශෝධනය |
|---|---|---|
| (i) | එකී පනතේ තෙවැනි උපලේඛනයේ II වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති වියදමෙහි උපරිම සීමාව | සංශෝධන නොමැත |
| (ii) | එකී පනතේ තෙවැනි උපලේඛනයේ III වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති ලැබීම්වල අවම සීමාව | රු.4,600,000,000 සිට රු.1,700,000,000 දක්වා |
| (iii) | එකී පනතේ තෙවැනි උපලේඛනයේ IV වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති හර ශේෂයන්ගේ උපරිම සීමාව | සංශෝධන නොමැත |
| (iv) | එකී පනතේ තෙවැනි උපලේඛනයේ V වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති බැරකම්හි උපරිම සීමාව | රු.1,600,000,000 සිට රු.16,000,000,000 දක්වා |

(මෙම නියමය වලංගු වන්නේ 2022.12.31 වැනි දින දක්වා පමණි.)

අත්සන් කළේ / රනිල් වික්‍රමසිංහ,
මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍ය

2023.02.28 වැනි දින,
කොළඹ 01.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*

මුදල්, ආර්ථික ස්ථායිකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යතුමා,— විසර්ජන පනත යටතේ යෝජනා සම්මතය (අංක 2),— 2021 අංක 30 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තිය යටතේ මුදල්, ආර්ථික ස්ථායිකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යවරයාට පැවරුන බලතල අනුව, ආණ්ඩුවේ අනුමතිය ඇතිව, මුදල්, ආර්ථික ස්ථායිකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යවරයා විසින් සාදන ලද පහත දැක්වෙන අංක 32 දරන නියමය අනුමත කළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා සම්මත කරයි:—

## 2021 අංක 30 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තිය යටතේ අංක 32 දරන නියමය

මුදල්, ආර්ථික ස්ථායිකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍ය, රනිල් වික්‍රමසිංහ වන මම 2021 අංක 30 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තියෙන් මා වෙත පවරනු ලැබ ඇති බලතල ප්‍රකාරව, ආණ්ඩුවේ අනුමතිය ඇතිව එකී පනතේ තෙවන උපලේඛනයේ විෂය අංක 22302 ''ගබඩා අත්තිකාරම් ගිණුම (පුපුරණ ද්‍රව්‍ය) - ශ්‍රී ලංකා නාවික හමුදාව'' වෙත පැවරී ඇති කාර්යය වෙනුවෙන් නිශ්චිතව දක්වා ඇති සීමාවන්, මෙම නියමය මඟින් සංශෝධනය කරමි.

| | <u>අයිතමය</u> | <u>සංශෝධනය</u> |
|---|---|---|
| (i) | එකී පනතේ තෙවැනි උපලේඛනයේ II වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති වියදමෙහි උපරිම සීමාව | රු.550,000,000 සිට රු.700,000,000 දක්වා |
| (ii) | එකී පනතේ තෙවැනි උපලේඛනයේ III වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති ලැබීම්වල අවම සීමාව | සංශෝධන නොමැත |
| (iii) | එකී පනතේ තෙවැනි උපලේඛනයේ IV වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති හර ශේෂයන්ගේ උපරිම සීමාව | සංශෝධන නොමැත |
| (iv) | එකී පනතේ තෙවැනි උපලේඛනයේ V වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති බැරකම්හි උපරිම සීමාව | සංශෝධන නොමැත |

(මෙම නියමය වලංගු වන්නේ 2022.12.31 වැනි දින දක්වා පමණි.)

අත්සන් කළේ / රනිල් වික්‍රමසිංහ,
මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික
ප්‍රතිපත්ති අමාත්‍ය

2023.02.28 වැනි දින,
කොළඹ 01.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*

මුදල්, ආර්ථික ස්ථායිකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යතුමා,— විසර්ජන පනත යටතේ යෝජනා සම්මතය (අංක 3),— 2021 අංක 30 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තිය යටතේ මුදල්, ආර්ථික ස්ථායිකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යවරයාට පැවරුන බලතල අනුව, ආණ්ඩුවේ අනුමතිය ඇතිව, මුදල්, ආර්ථික ස්ථායිකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යවරයා විසින් සාදන ලද පහත දැක්වෙන අංක 33 දරන නියමය අනුමත කළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා සම්මත කරයි:—

## 2021 අංක 30 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තිය යටතේ අංක 33 දරන නියමය

මුදල්, ආර්ථික ස්ථායිකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍ය, රනිල් වික්‍රමසිංහ වන මම 2021 අංක 30 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තියෙන් මා වෙත පවරනු ලැබ ඇති බලතල ප්‍රකාරව, ආණ්ඩුවේ අනුමතිය ඇතිව එකී පනතේ තෙවන උපලේඛනයේ විෂය අංක 28502 "කෘෂිකාර්මික ගොවිපොළ නඩත්තුව හා බීජ අලෙවිය අත්තිකාරම් ගිණුම - කෘෂිකර්ම දෙපාර්තමේන්තුව" වෙත පැවරී ඇති කාර්යය වෙනුවෙන් නිශ්චිතව දක්වා ඇති සීමාවන්, මෙම නියමය මඟින් සංශෝධනය කරමි.

| | අයිතමය | සංශෝධනය |
|---|---|---|
| (i) | එකී පනතේ තෙවැනි උපලේඛනයේ II වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති වියදමෙහි උපරිම සීමාව | රු.660,000,000 සිට රු.850,000,000 දක්වා |
| (ii) | එකී පනතේ තෙවැනි උපලේඛනයේ III වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති ලැබීම්වල අවම සීමාව | රු.660,000,000 සිට රු.850,000,000 දක්වා |
| (iii) | එකී පනතේ තෙවැනි උපලේඛනයේ IV වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති හර ශේෂයන්ගේ උපරිම සීමාව | සංශෝධන නොමැත |
| (iv) | එකී පනතේ තෙවැනි උපලේඛනයේ V වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති බැරකම්හි උපරිම සීමාව | සංශෝධන නොමැත |

(මෙම නියමය වලංගු වන්නේ 2022.12.31 වැනි දින දක්වා පමණි.)

අත්සන් කළේ / රනිල් වික්‍රමසිංහ,
මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික
ප්‍රතිපත්ති අමාත්‍ය

2023.02.28 වැනි දින,
කොළඹ 01.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*

මුදල්, ආර්ථික ස්ථායිකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යතුමා,— විසර්ජන පනත යටතේ යෝජනා සම්මතය (අංක 4),— 2021 අංක 30 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තිය යටතේ මුදල්, ආර්ථික ස්ථායිකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යවරයාට පැවරුන බලතල අනුව, ආණ්ඩුවේ අනුමතිය ඇතිව, මුදල්, ආර්ථික ස්ථායිකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යවරයා විසින් සාදන ලද පහත දැක්වෙන අංක 34 දරන නියමය අනුමත කළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා සම්මත කරයි:—

# 2021 අංක 30 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තිය යටතේ අංක 34 දරන නියමය

මුදල්, ආර්ථික ස්ථායිකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍ය, රනිල් වික්‍රමසිංහ වන මම 2021 අංක 30 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තියෙන් මා වෙත පවරනු ලැබ ඇති බලතල ප්‍රකාරව, ආණ්ඩුවේ අනුමතිය ඇතිව එකී පනතේ තෙවන උපලේඛනයේ විෂය අංක 30602 “ගබඩා අත්තිකාරම් ගිණුම - දුම්රිය දෙපාර්තමේන්තුව” වෙත පැවරී ඇති කාර්යය වෙනුවෙන් නිශ්චිතව දක්වා ඇති සීමාවන්, මෙම නියමය මඟින් සංශෝධනය කරමි.

| | <u>අයිතමය</u> | <u>සංශෝධනය</u> |
|---|---|---|
| (i) | එකී පනතේ තෙවැනි උපලේඛනයේ II වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති වියදමෙහි උපරිම සීමාව | සංශෝධන නොමැත |
| (ii) | එකී පනතේ තෙවැනි උපලේඛනයේ III වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති ලැබීම්වල අවම සීමාව | රු.2,000,000,000සිට රු.1,000,000,000දක්වා |
| (iii) | එකී පනතේ තෙවැනි උපලේඛනයේ IV වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති හර ශේෂයන්ගේ උපරිම සීමාව | රු.8,200,000,000සිට රු.9,000,000,000දක්වා |
| (iv) | එකී පනතේ තෙවැනි උපලේඛනයේ V වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති බැරකම්හි උපරිම සීමාව | සංශෝධන නොමැත |

(මෙම නියමය වලංගු වන්නේ 2022.12.31 වැනි දින දක්වා පමණි.)

අත්සන් කළේ / රනිල් වික්‍රමසිංහ,
මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍ය

2023.02.28 වැනි දින,
කොළඹ 01.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*

මුදල්, ආර්ථික ස්ථායිකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යතුමා,— විසර්ජන පනත යටතේ යෝජනා සම්මතය (අංක 5),— 2021 අංක 30 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තිය යටතේ මුදල්, ආර්ථික ස්ථායිකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යවරයාට පැවරුන බලතල අනුව, ආණ්ඩුවේ අනුමතිය ඇතිව, මුදල්, ආර්ථික ස්ථායිකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යවරයා විසින් සාදන ලද පහත දැක්වෙන අංක 35 දරන නියමය අනුමත කළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා සම්මත කරයි:—

## 2021 අංක 30 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තිය යටතේ අංක 35 දරන නියමය

මුදල්, ආර්ථික ස්ථායිකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍ය, රනිල් වික්‍රමසිංහ වන මම 2021 අංක 30 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තියෙන් මා වෙත පවරනු ලැබ ඇති බලතල ප්‍රකාරව, ආණ්ඩුවේ අනුමතිය ඇතිව එකී පනතේ තෙවන උපලේඛනයේ විෂය අංක 31003 "කළමනාකරණ අත්තිකාරම් ගිණුම - රජයේ කර්මාන්ත ශාලාව" වෙත පැවරී ඇති කාර්යය වෙනුවෙන් නිශ්චිතව දක්වා ඇති සීමාවන්, මෙම නියමය මගින් සංශෝධනය කරමි.

| | අයිතමය | සංශෝධනය |
|---|---|---|
| (i) | එකී පනතේ තෙවැනි උපලේඛනයේ II වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති වියදමෙහි උපරිම සීමාව | රු.400,000,000 සිට රු.410,000,000 දක්වා |
| (ii) | එකී පනතේ තෙවැනි උපලේඛනයේ III වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති ලැබීම්වල අවම සීමාව | රු.390,000,000 සිට රු.350,000,000 දක්වා |
| (iii) | එකී පනතේ තෙවැනි උපලේඛනයේ IV වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති හර ශේෂයන්ගේ උපරිම සීමාව | සංශෝධන නොමැත |
| (iv) | එකී පනතේ තෙවැනි උපලේඛනයේ V වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති බැරකම්හි උපරිම සීමාව | සංශෝධන නොමැත |

(මෙම නියමය වලංගු වන්නේ 2022.12.31 වැනි දින දක්වා පමණි.)

අත්සන් කළේ / රනිල් වික්‍රමසිංහ,
මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික
ප්‍රතිපත්ති අමාත්‍ය

2023.02.28 වැනි දින,
කොළඹ 01.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*

අග්‍රාමාත්‍යතුමා සහ මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යතුමා,— 2020 අංක 7 දරන විසර්ජන පනත යටතේ යෝජනා සම්මතය (අංක 6),— 2021 අංක 30 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තිය යටතේ මුදල්, ආර්ථික ස්ථායිකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යවරයාට පැවරුන බලතල ප්‍රකාරව, ආණ්ඩුවේ අනුමතිය ඇතිව, මුදල්, ආර්ථික ස්ථායිකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යවරයා විසින් සාදන ලද මෙහි පහත උපලේඛනයෙහි නිශ්චිතව දක්වා ඇති නියමයන් අනුමත කළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා සම්මත කරයි:—

(මෙම නියමයන් වලංගු වන්නේ 2021.12.31 වැනි දින දක්වා පමණි.)

<u>උපලේඛනය</u>

(අමුණා ඇති උපලේඛනය පරිදි)

## උපලේඛනය

## 2021 අංක 30 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තිය අනුව කරන විධානය

2021 අංක 30 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තිය යටතේ 2022 මුදල් වර්ෂය සඳහා රාජ්‍ය නිලධාරින්ට අත්තිකාරම් ගිණුම් සම්බන්ධයෙන් මුදල්, ආර්ථික ස්ථායිකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යවරයා විසින් බලය දෙන සීමා වෙනස් කිරීමේ උපලේඛනය.

**කණ්ඩායම් විධාන අංක 01**

2021 අංක 30 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තිය අනුව මුදල්, ආර්ථික ස්ථායිකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යවරයා වෙත පැවරි ඇති බලතලවලට අනුව රනිල් වික්‍රමසිංහ වන මම, මුදල්, ආර්ථික ස්ථායිකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යවරයා වශයෙන් රජයේ අනුමතිය යටතේ මේ සමඟ දක්වා ඇති උපලේඛනයේ දැක්වෙන ආකාරයට රාජ්‍ය නිලධාරින්ගේ අත්තිකාරම් ගිණුම්වල විෂය අංක 00201, 10501, 11101, 11801, 11901, 12601, 13001, 14901, 18701, 18901, 22201, 22301, 22401, 22501, 23201, 23501, 24201, 24901, 26001, 26501, 26901, 27701, 28101, 28801, 29301, 30601, 32001, 33101, 33401, 33601 ට අදාළ වන්නාවූ පනතේ තෙවන උපලේඛනය තීරු අංක II සහ IV හි දක්වා ඇති උපරිම සීමාවන් සහ අංක III හි දක්වා ඇති අවම සීමාවන් සංශෝධනය කරමි.

| අනු අංකය | අමාත්‍යාංශය / දෙපාර්තමේන්තුව | විෂය අංකය | II රජයේ කටයුතු සඳහා වියදමෙහි උපරිම සීමාව | | III රජයේ කටයුතු පිළිබඳ ගිණුම්වලට බැර කළ යුතු ලැබීම්වල අවම සීමාව | | IV රජයේ කටයුතුවල හර ශේෂයන්ගේ උපරිම සීමාව | | නියෝග අංකය |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | | සිට | දක්වා | සිට | දක්වා | සිට | දක්වා | |
| | | | රු. | රු. | රු. | රු. | රු. | රු. | |
| 1 | අග්‍රාමාත්‍ය කාර්යාලය | 00201 | - | - | 12,000,000 | 11,000,000 | - | - | 1 |
| 2 | ජනමාධ්‍ය අමාත්‍යවරයා | 10501 | - | - | 5,100,000 | 4,500,000 | - | - | 2 |
| 3 | සෞඛ්‍ය අමාත්‍යවරයා | 11101 | - | - | 1,422,500,000 | 1,199,000,000 | - | - | 3 |
| 4 | කෘෂිකර්ම අමාත්‍යවරයා | 11801 | - | - | 44,000,000 | 40,000,000 | - | - | 4 |
| 5 | විදුලිබල හා බලශක්ති අමාත්‍යවරයා | 11901 | - | - | 7,200,000 | 6,500,000 | - | - | 5 |
| 6 | අධ්‍යාපන අමාත්‍යවරයා | 12601 | - | - | 1,637,000,000 | 1,100,000,000 | - | - | 6 |

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| 7 | රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යවරයා | 13001 | - | - | 732,000,000 | 555,000,000 | - | - | 7 |
| 8 | කර්මාන්ත අමාත්‍යවරයා | 14901 | - | - | 36,200,000 | 20,000,000 | - | - | 8 |
| 9 | ආයෝජන ප්‍රවර්ධන අමාත්‍යවරයා | 18701 | 1,500,000 | 33,000,000 | - | - | 2,000,000 | 22,500,000 | 9 |
| 10 | මහජන ආරක්ෂක අමාත්‍යවරයා | 18901 | - | - | 72,550,000 | 52,000,000 | - | - | 10 |
| 11 | ශ්‍රී ලංකා යුද්ධ හමුදාව | 22201 | - | - | 3,000,000,000 | 2,100,000,000 | - | - | 11 |
| 12 | ශ්‍රී ලංකා නාවික හමුදාව | 22301 | - | - | 400,000,000 | 330,000,000 | - | - | 12 |
| 13 | ශ්‍රී ලංකා ගුවන් හමුදාව | 22401 | - | - | 320,000,000 | 310,000,000 | - | - | 13 |
| 14 | පොලිස් දෙපාර්තමේන්තුව | 22501 | - | - | 1,000,000,000 | 800,000,000 | - | - | 14 |
| 15 | බන්ධනාගාර දෙපාර්තමේන්තුව | 23201 | - | - | 130,000,000 | 110,000,000 | - | - | 15 |
| 16 | නීති කොමිෂන් සභා දෙපාර්තමේන්තුව | 23501 | - | - | 700,000 | 600,000 | - | - | 16 |
| 17 | කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව | 24201 | - | - | 4,000,000 | 3,250,000 | - | - | 17 |
| 18 | භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව | 24901 | - | - | 6,000,000 | 5,500,000 | - | - | 18 |
| 19 | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, නුවරඑළිය | 26001 | - | - | 35,000,000 | 31,000,000 | - | - | 19 |
| 20 | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය / කච්චේරිය - මන්නාරම | 26501 | - | - | 12,000,000 | 11,000,000 | - | - | 20 |
| 21 | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය / කච්චේරිය - මඩකලපුව | 26901 | - | - | - | - | 140,000,000 | 149,000,000 | 21 |
| 22 | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - මොණරාගල | 27701 | 35,000,000 | 35,395,000 | - | - | - | - | 22 |
| 23 | ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව | 28101 | - | - | 280,000,000 | 200,000,000 | - | - | 23 |
| 24 | ශ්‍රී ලංකා මිනින්දෝරු දෙපාර්තමේන්තුව | 28801 | - | - | 130,000,000 | 126,000,000 | - | - | 24 |
| 25 | රබර් සංවර්ධන දෙපාර්තමේන්තුව | 29301 | - | - | 18,000,000 | 16,500,000 | - | - | 25 |
| 26 | ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව | 30601 | - | - | 450,000,000 | 420,000,000 | - | - | 26 |

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| 27 | සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව | 32001 | - | - | 480,000,000 | 360,000,000 | - | - | 27 |
| 28 | සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව | 33101 | - | - | 280,000,000 | 198,000,000 | - | - | 28 |
| 29 | බහුකාර්ය සංවර්ධන කාර්ය සාධක බලකා දෙපාර්තමේන්තුව | 33401 | - | - | 16,000,000 | 12,000,000 | 50,000,000 | 60,000,000 | 29 |
| 30 | වෙළඳ නාවික ලේකම් කාර්යාලය | 33601 | 2,000,000 | 2,200,000 | - | - | - | - | 30 |

අත්සන් කළේ / රනිල් වික්‍රමසිංහ,
මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍ය

2023.02.28
කොළඹ 01.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

***සලකුණෙන් හඳුන්වනු ලබන්නේ ආණ්ඩුවේ කටයුතු ය.***

**2023 මාර්තු 22 බදාදා**

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

3/2023

ගරු චමින්ද විජේසිරි මහතා,— මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) අර්ජුන් මහේන්ද්‍රන් මහතා ශ්‍රී ලංකා මහ බැංකුවේ අධිපති ලෙස කටයුතු කරන ලද කාල සීමාව කවරේද;

(ii) එකී කාල සීමාව තුළදී ශ්‍රී ලංකා මහ බැංකුවේ බැඳුම්කර වංචාවක් සිදු වූ බව පිළිගන්නේද;

(iii) එම බැඳුම්කර වංචාවට අර්ජුන් මහේන්ද්‍රන් මහතා සෘජුවම සම්බන්ධ බවට ඒ සම්බන්ධයෙන් පත් කරන ලද ජනාධිපති විමර්ශන කොමිෂන් සභාව විසින් චෝදනා කරන ලද බව දන්නේද;

(iv) අර්ජුන් මහේන්ද්‍රන් මහතා ශ්‍රී ලංකා මහ බැංකුවේ අධිපති තනතුරට පත්කිරීම සඳහා නිර්දේශ කරන ලද හා එම පත්කිරීම අනුමත කරන ලද දේශපාලන අධිකාරියේ පුද්ගලයන්ගේ නම් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

380/2023

ගරු නිතිඥ වසන්ත යාපාබණ්ඩාර මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මහනුවර දිස්ත්‍රික්කයේ, ජාතික පාසල්, කණිෂ්ඨ පාසල් හා ප්‍රාථමික පාසල් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) ඉහත සඳහන් එක් එක් පාසල් වර්ගයේ ඉගෙනුම ලබන සිසුන් සංඛ්‍යාව සහ සේවය කරනු ලබන ගුරුවරුන් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) ඉහත සඳහන් පාසල් අතරින් ගුරු අතිරික්තයක් පවතින සහ ගුරු හිඟයක් පවතින පාසල් වෙන් වෙන් වශයෙන් හඳුනාගෙන තිබේද;

(iv) ගුරු හිඟයක් පවතින පාසල්වල ගුරු හිඟය මඟහරවා ගැනීම සඳහා ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

418/2023

ගරු ගයන්ත කරුණාතිලක මහතා,— කෘෂිකර්ම අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවේ වාර්ෂික කිරි අවශ්‍යතාවයෙන් දියර කිරිවලින් සපුරා ගනු ලබන ප්‍රමාණය ප්‍රතිශතයක් ලෙස සහ ලීටර්වලින් වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) දියර කිරි සඳහා ස්ථාවර මිලක් නියම කර තිබේද;

(iii) පසුගිය වර්ෂ දෙකක කාලය තුළ දියර කිරි නිෂ්පාදනය ඉහළ නැංවීම සඳහා ගෙන ඇති පියවර කවරේද;

(iv) දියර කිරි පරිභෝජනය ඉහළ නැංවීම සඳහා මේ වනවිට ගෙන ඇති පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

474/2023

ගරු බුද්ධික පතිරණ මහතා,— ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක වන කුලී රථ හා ඒ ආශ්‍රිත සේවා සපයනු ලබන විදේශීය සමාගම්වල නම් කවරේද;

(ii) 2017.01.01 සිට 2021.12.31 දක්වා එම එක් එක් සමාගම විසින් උපයන ලද ආදායම එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් රුපියල්වලින් කොපමණද;

(iii) ඉහත සඳහන් කාලයේදී එම එක් එක් සමාගම විසින් ගෙවන ලද බදු මුදල එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් රුපියල්වලින් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) කුලී රථ හා ඒ ආශ්‍රිත සේවා සැපයීම සඳහා විදේශීය සමාගම් සම්බන්ධ වීම හේතුවෙන් ශ්‍රී ලංකාවේ එම සේවා සපයනු ලබන පුද්ගලයන් හා සමාගම් අසීරුතාවයට පත් වී ඇති බව පිළිගන්නේද;

(ii) ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක වන කුලී රථ සේවය නියාමනය කිරීමට හා සුරක්ෂිත කිරීමට ක්‍රියාමාර්ග ගෙන තිබේද;

(iii) එසේ නම්, එම ක්‍රියාමාර්ග කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

686/2023

ගරු ෂානක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 1300කට අධික ව්‍යාපාරිකයන් පිරිසක් සිය ව්‍යාපාරික කටයුතුවල නිරත වන කලවංචිකුඩි වෙළඳ මධ්‍යස්ථානයෙහි/වෙළඳපොළෙහි සනීපාරක්ෂක පහසුකම් සහ කාණු පද්ධති වැනි මූලික යටිතල පහසුකම් ප්‍රමාණවත් නොවන බවත්;

(ii) ව්‍යාපාරික කටයුතු සඳහා ස්ථිර ගොඩනැගිලි නොමැතිවීම හේතුවෙන් එළිමහන් ස්ථානවල ව්‍යාපාරික කටයුතු සිදුකරන අතර වර්ෂා කාලවලදී ව්‍යාපාරිකයන් දැඩි දුෂ්කරතාවයන්ට මුහුණ දෙනු ලබන බවත්;

(iii) මෙම ස්ථානයේ ඇති මත්ස්‍ය වෙළඳපොළ තාක්ෂණික පහසුකම් සහිතව අලුත්වැඩියා කර නොමැති වීම හේතුවෙන් මත්ස්‍ය ව්‍යාපාරිකයන් විවිධ දුෂ්කරතාවයන්ට මුහුණ දෙනු ලබන බවත්;

(iv) එහි මාර්ග අබලන් තත්ත්වයක පවතින බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) ඉහත වෙළෙඳ මධ්‍යස්ථානය/වෙළඳපොළ සංවර්ධනය කිරීම සඳහා පියවර ගන්නේද;

(ii) එසේ නම්, එම සංවර්ධන කටයුතු ආරම්භ කරනු ලබන දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

816/2023

ගරු ජගත් කුමාර සුමිත්‍රාආරච්චි මහතා,— මහජන ආරක්ෂක අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2022.05.09 වන දින ශ්‍රී ලංකාවේ පැවති කලබලකාරි අවස්ථාවේදී තම වගකීම පැහැර හරින ලද පොලිස් නිලධාරින් සංඛ්‍යාව එක් එක් තනතුර අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එම නිලධාරින්ට එරෙහිව ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

(iii) ඉහත දින හා ඊට ආසන්න මාස කිහිපය තුළ නියෝජ්‍ය පොලිස්පතිවරයෙකු ඇතුළු පොලිස් නිලධාරින් කිහිපදෙනෙකුට ප්‍රසිද්ධියේ හිරිහැර කරමින් හා රාජකාරියට බාධා කරමින් ප්‍රකෝපකාරි ලෙස හැසිරුණු පුද්ගලයන් සිටින බව පිළිගන්නේද;

(iv) මේ වනවිට එම පුද්ගලයන් හඳුනාගෙන තිබේද;

(v) එසේ නම්, ඔවුන්ට එරෙහිව නීතිය ක්‍රියාත්මක කර තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) 2022.05.09 දින ඇති වූ කලබලකාරි තත්ත්වය මධ්‍යයේ පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකු ඝාතනයට ලක් වූ බව දන්නේද;

(ii) එම ඝාතනයට සම්බන්ධ වූ පුද්ගලයන් හඳුනාගෙන තිබේද;

(iii) එසේ නම්, එම පුද්ගලයන් සංඛ්‍යාව කොපමණද;

(iv) ඔවුන්ට විරුද්ධව නීතිය ක්‍රියාත්මක කර තිබේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1797/2023

ගරු කුමාරසිරි රත්නායක මහතා,— කර්මාන්ත අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) දේශීය කර්මාන්ත දිරිගැන්වීමේ වැඩසටහන යටතේ බුත්තල කර්මාන්තපුරයේ ව්‍යවසායකයන් සඳහා මූල්‍ය ප්‍රදානයන් ලබා දී තිබේද;

(ii) එසේ නම්, එම මූල්‍ය ප්‍රදානය ලබා දෙන ලද ව්‍යවසායකයන් සංඛ්‍යාව කොපමණද;

(iii) එම මූල්‍ය ප්‍රදානයන් ලබා දෙන ලද එක් එක් පුද්ගලයා/ආයතනය වෙන් වෙන් වශයෙන් කවරේද;

(iv) එම එක් එක් පුද්ගලයා/ආයතනය සඳහා ලබා දෙන ලද මුදල කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) මූල්‍ය ප්‍රදානයන් ලබා ගන්නා ලද සියලු ව්‍යවසායකයන් මේ වනවිට තම කර්මාන්ත ආරම්භ කර තිබේද;

(ii) එම කර්මාන්ත අතරින් විදේශීය වෙළඳපොළ සඳහා සිය නිෂ්පාදන අලෙවි කරනු ලබන කර්මාන්ත කවරේද;

(iii) 2022 පළමු කාර්තුව තුළ එම කර්මාන්තවලින් උපයා ගෙන ඇති විදේශ විනිමය කොපමණද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1806/2023

ගරු අජිත් මාන්නප්පෙරුම මහතා,— ආයෝජන ප්‍රවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවේ මේ වනවිට ස්ථාපිත කර ඇති නිදහස් වෙළඳ කලාප සංඛ්‍යාව කොපමණද;

(ii) ඒවායේ නම් කවරේද;

(iii) 2015 වර්ෂයේ සිට මේ දක්වා එම එක් එක් නිදහස් වෙළඳ කලාපයේ යටිතල පහසුකම් සංවර්ධනය කිරීම සඳහා වැය කරන ලද මුදල වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) විදේශ ආයෝජන ආකර්ෂණය කර ගැනීම සඳහා යටිතල පහසුකම් සංවර්ධනය කිරීම අත්‍යාවශ්‍ය වන බැවින් ඉහත සඳහන් නිදහස් වෙළඳ කලාපවල යටිතල පහසුකම් සංවර්ධනය කිරීම සඳහා ගනු ලබන පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2012/2023

ගරු යදාමිණි ගුණවර්ධන මහතා,— වාරිමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මහවැලි, වලවේ සහ ගල්ඔය ආදී ගංගා නිම්න බහු කාර්ය සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමෙන් එම නිම්න ආශ්‍රිතව ගංවතුර පාලනය වීමෙන් වාර්ෂිකව ගංගා ආශ්‍රිතව ජීවත්වන ජනතාවට හා ජාතික ආර්ථිකයට සිදු වන හානිය අවම වී තිබෙන බවත්;

(ii) කැළණි ගඟ ආශ්‍රිතව බහුකාර්ය සංවර්ධන ව්‍යාපෘතියක් මේ දක්වා ක්‍රියාත්මක කර නොමැති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) ගංවතුර හානි පූරණය කිරීම සඳහා පසුගිය වසර 05ක කාලය තුළ වෙන් කරන ලද ප්‍රතිපාදනය;

(ii) එම මුදලෙන් කැළණි ගඟේ ගංවතුර හේතුවෙන් සිදු වූ හානි පූරණය කිරීමට වෙන් කරන ලද මුදල;

(iii) පසුගිය වසර 05 කාලය තුළ ගංවතුර හේතුවෙන් ආපදාවට ලක් වූ පුද්ගලයන් සංඛ්‍යාව;

(iv) ඒ අතරින් කැළණි ගඟේ ගංවතුර හේතුවෙන් ආපදාවට ලක් වූ පුද්ගලයන් සංඛ්‍යාව;

කොපමණද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) කැළණි ගඟේ ගංවතුර පාලනය කිරීමට වෙන් කර ඇති මුදල ප්‍රමාණවත් වන්නේද;

(ii) කැළණි ගඟ ආශ්‍රිත ගංවතුර තත්ත්වය පාලනය කිරීමට ව්‍යාපෘති සැලසුමක් සකස් කර තිබේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2526/2023

ගරු ඉම්රාන් මහරූෆ් මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) උපාධිධාරී අභ්‍යාසලාභීන් ලෙස 2020 වසරේදී ප්‍රාදේශීය ලේකම් කාර්යාල වෙත අනුයුක්ත කරනු ලැබූ උපාධිධාරීන්ගෙන් යම් නිශ්චිත පිරිසක් පාසල්වලට අනුයුක්ත කරන ලද බවත්;

(ii) එම පිරිස පාසල් නිවාඩු කාලයේදී නැවත රාජ්‍ය ආයතන වෙත කැඳවනු ලබන බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) ඉහත (අ)(i)හි සඳහන් උපාධිධාරී අභ්‍යාසලාභීන් පුහුණුව අවසානයේදී පත් කරනු ලබන්නේ ගුරුවරුන් වශයෙන්ද නැතහොත් සංවර්ධන නිලධාරීන් වශයෙන්ද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) ඉහත සඳහන් උපාධිධාරී අභ්‍යාසලාභීන් සේවය කරනු ලබන පදනම;

(ii) ඔවුන්ගේ සේවය ස්ථිර කරනු ලබන දිනය;

කවරේද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

---

**2023 මාර්තු 23 බ්‍රහස්පතින්දා**

## වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

834/2023

ගරු ප්‍රේම්නාත් සී. දොලවත්ත මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මේ වනවිට පවතින කැබිනට් අමාත්‍යාංශ සංඛ්‍යාව සහ රාජ්‍ය අමාත්‍යාංශ සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) ඒවායේ නම් කවරේද;

(iii) ඉහත අමාත්‍යාංශ අතරින් පෞද්ගලික ගොඩනැගිලිවල සිය අමාත්‍යාංශ කාර්යාල පවත්වා ගෙන යනු ලබන කැබිනට් අමාත්‍යාංශ හා රාජ්‍ය අමාත්‍යාංශ සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) ඒවායේ නම් කවරේද;

(v) එම එක් එක් කාර්යාලය සඳහා ගෙවනු ලබන මාසික කුලී මුදල වෙන් වෙන් වශයෙන් කොපමණද;

(vi) පෞද්ගලික ගොඩනැගිලිවල පවත්වාගෙන යනු ලබන අමාත්‍යාංශ කාර්යාල රජයේ ගොඩනැගිලි වෙත ගෙන යාම සඳහා ගනු ලබන පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

849/2023

ගරු ගාමිණී වලේබොඩ මහතා,— බුද්ධශාසන, ආගමික සහ සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා ගෙන් ඇසීමට,— (1)

(අ) (i) කතුවරුන්ගේ අවසරයකින් තොරව මුද්‍රිත ග්‍රන්ථ ලාභ ඉපයීමේ අරමුණින් පී.ඩී.එෆ් (pdf) බවට පරිවර්තනය කර බෙදා හැරීම හේතුවෙන් එම කතුවරුන් දැඩි අසාධාරණයකට ලක් වී ඇති බව දන්නේද;

(ii) මෙම තත්ත්වය මැඩපවත්වීම සඳහා සහ අගතියට පත් ග්‍රන්ථ කතුවරුන්ට සාධාරණයක් ඉටුකර දීම සඳහා ගෙන ඇති පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) මේ වනවිට මුද්‍රිත පිටපත් නොමැති ග්‍රන්ථ පී.ඩී.එෆ්, (pdf) බවට පරිවර්තනය කර සංරක්ෂණය කිරීම වැදගත් බව පිළිගන්නේද;

(ii) එසේ නම්, ඒ සඳහා ගෙන ඇති පියවර කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

860/2023

ගරු රවුෆ් හකීම් මහතා,— සෞඛ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) වර්ෂ 2019 සිට 2022 දක්වා කාලය තුළ ශ්‍රී ලංකාවේ —

(i) රසායනාගාර පරීක්ෂණවලින් තහවුරු කරන ලද කොවිඩ්-19 රෝගීන් සංඛ්‍යාව;

(ii) තහවුරු කරන ලද කොවිඩ්-19 මරණ සංඛ්‍යාව;

(iii) එම මරණ සංඛ්‍යාව වයස, ස්ත්‍රී පුරුෂ සමාජභාවය, පදිංචි පළාත සහ දිස්ත්‍රික්කය, ජනවර්ගය සහ ආගම අනුව වෙන් වෙන් වශයෙන්;

කොපමණද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) වර්ෂ 2019 සිට 2022 දක්වා කාලය තුළ ශ්‍රී ලංකාවේ කොවිඩ්-19 —

(i) මෘතදේහ බැහැර කිරීම සඳහා යොදාගත් ක්‍රමවේද/ ක්‍රමවේදය කවරේද;

(ii) ආදාහනය කිරීමෙන් බැහැර කරන ලද මෘතදේහ සංඛ්‍යාව කොපමණද ;

(iii) භූමදානය කිරීමෙන් බැහැර කරන ලද මෘතදේහ සංඛ්‍යාව කොපමණද;

(iv) වයස, ස්ත්‍රී පුරුෂ සමාජ භාවය, පළාත සහ දිස්ත්‍රික්කය, ජනවර්ගය සහ ආගම අනුව ආදාහනය කරන ලද සහ භූමදානය කරන ලද මෘතදේහ සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම් ඒ මන්ද?

865/2023

ගරු රෝහණ බංඩාර මහතා,— වෙළඳ, වාණිජ හා ආහාර සුරක්ෂිතතා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) සී/ස අධ්‍යාපන සේවා නියුක්තිකයින්ගේ සමුපකාර සකසුරුවම් සහ ණයදෙන සමිතියේ මේ වනවිට සේවය කරනු ලබන සේවකයන් සංඛ්‍යාව කොපමණද;

(ii) වර්ෂ 2015 සිට මේ දක්වා එම සමිතියට බඳවාගෙන ඇති සේවකයන් සංඛ්‍යාව එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) අධ්‍යාපනික හා වෘත්තීය සුදුසුකම් මත ඉහත සමිතිය සඳහා සේවකයන් බඳවාගැනීමට හා උසස්වීම් ලබාදීමට ගනු ලබන පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1299/2023

ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා,— විදුලිබල හා බලශක්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ වර්තමාන සභාපතිවරයාගේ නම කවරේද;

(ii) ඔහුට ගෙවනු ලබන වැටුප්, දීමනා සහ වරප්‍රසාද කවරේද;

(iii) ඉන්ධන මිල ඉහළ යමින් පවතින අවස්ථාවක ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ ඉහළ නිලධාරින්ට ලබා දෙන සුවිශේෂී වරප්‍රසාද සීමා කළ යුතු බව පිළිගන්නේද;

(iv) එසේ නම්, ඒ සම්බන්ධයෙන් අමාත්‍යාංශය විසින් ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1304/2023

ගරු කිංස් නෙල්සන් මහතා,— වාරිමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවේ එක් එක් මහවැලි කලාපයේ ජීවත්වන පවුල් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එම පවුල් අතරින් සිය ඉඩම් සඳහා හිමිකම් ඔප්පු ලැබී ඇති සහ ලැබී නොමැති පවුල් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) හිමිකම් ඔප්පු ලැබී නොමැති පවුල් සඳහා හිමිකම් ඔප්පු ලබා දීමට ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1311/2023

ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා,— විදුලිබල හා බලශක්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මහවැලි බහුකාර්ය යෝජනා ක්‍රමයට අයත් විදුලි බලාගාරවලින් උත්පාදනය කරනු ලබන මුළු විදුලිබල ප්‍රමාණය මෙගාවොට් කොපමණද;

(ii) එම ප්‍රමාණය, ශ්‍රී ලංකාවේ සමස්ත විදුලිබල උත්පාදනයෙන් කවර ප්‍රතිශතයක්ද;

(iii) මහවැලි බහුකාර්ය යෝජනා ක්‍රමය යටතේ ඉදිරියේදී නව විදුලි බලාගාර ඉදිකිරීමට සැලසුම් කර තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1317/2023

ගරු මොහමඩ් මුසම්මිල් මහතා,— අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවේ මේ වනවිට ක්‍රියාත්මක වන කාති උසාවි සංඛ්‍යාව කොපමණද;

(ii) කාති උසාවි මඟින් ලබා දෙන ලද තීන්දු අනුව වර්ෂ 2015 සිට මේ දක්වා සිදු වී ඇති දික්කසාද සංඛ්‍යාව කොපමණද;

(iii) කාති උසාවිවල සේවය කරන වයස 60 ඉක්මවූ කාතිවරුන් සංඛ්‍යාව කොපමණද;

(iv) උපාධි සුදුසුකම් සහිත කාතිවරුන් සංඛ්‍යාව කොපමණද;

(v) කාතිවරුන් තෝරාගනු ලබන ක්‍රමවේදය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1322/2023

ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය,— අග්‍රාමාත්‍යතුමා සහ රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මාතලේ දිස්ත්‍රික්කයේ රාජ්‍ය ආයතන සඳහා අනුමත තාක්ෂණ නිලධාරි තනතුරු සංඛ්‍යාව;

(ii) මේ වනවිට සේවය කරනු ලබන තාක්ෂණ නිලධාරීන් සංඛ්‍යාව;

(iii) මේ වනවිට ඉහත සඳහන් තනතුරේ පවතින පුරප්පාඩු සංඛ්‍යාව;

කොපමණද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) තාක්ෂණ නිලධාරි තනතුරේ පුරප්පාඩු පැවතීම මාතලේ දිස්ත්‍රික්කයේ ඉදිකිරීම් කටයුතු සඳහා අහිතකර ලෙස බලපාන බව පිළිගන්නේද;

(ii) එසේ නම්, එම පුරප්පාඩු පිරවීමට ගනු ලබන පියවර කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1328/2023

ගරු ඉෂාක් රහුමාන් මහතා,— මුදල්, ආර්ථික ස්ථායිකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) අනුරාධපුර දිස්ත්‍රික්කයේ ඇති මහජන බැංකු ශාඛා සංඛ්‍යාව කොපමණද;

(ii) වර්ෂ 2015 සිට 2020 දක්වා එම ශාඛා විසින් රුපියල් මිලියන 5කට වඩා වැඩි ණය ලබා දෙන ලද සමාගම් හා පුද්ගලයන් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) එම කාලය තුළ ලබා දෙන ලද ණය මුදල් අතරින් මේ වනවිට අය කර ගැනීමට නොහැකිවී ඇති ණය මුදල් ප්‍රමාණය කොපමණද;

(iv) එම ණය මුදල් අයකර ගැනීම සඳහා නීතිමය ක්‍රියාමාර්ග ගෙන තිබේද;

(v) ඉහත (iii)හි සඳහන් ණය මුදල් අතරින් බොල් ණය ලෙස කපා හැර ඇති ණය මුදල කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

---

**2023 මාර්තු 24 සිකුරාදා**

## වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

1458/2023

ගරු මායාදුන්න චින්තක අමල් මහතා,— ධීවර අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවට වාර්ෂිකව ආනයනය කරනු ලබන ටින්මාළු ප්‍රමාණය ටොන්වලින් කොපමණද;

(ii) ඒ සඳහා වැය කරනු ලබන මුදල කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ශ්‍රී ලංකාවේ මිරිදිය මාළු, ටින් කිරීම සඳහා පෞද්ගලික ව්‍යවසායකයන් ඉදිරිපත් වී තිබේද;

(ii) එසේ නම්, මිරිදිය මාළු, ටින් කිරීමේ කර්මාන්තශාලා ආරම්භ කිරීම සඳහා තෝරා ගෙන ඇති ජලාශ කවරේද;

(iii) එම කර්මාන්තශාලා ආරම්භ කිරීම සම්බන්ධයෙන් මේ වනවිට ගෙන ඇති පියවර කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1504/2023

ගරු කෝකිලා ගුණවර්ධන මහත්මිය,— කර්මාන්ත අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වේවැල්, බට සහ තල්කොළ ආශ්‍රිත භාණ්ඩ නිෂ්පාදනය කිරීමේ කර්මාන්ත දිරිගැන්වීම සඳහා ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේද;

(ii) එම භාණ්ඩ අලෙවි කිරීම සඳහා වෙළෙඳපොළක් තිබේද;

(iii) එම භාණ්ඩ අපනයනය කිරීම සඳහා වැඩපිළිවෙළක් තිබේද;

(iv) ඉහත භාණ්ඩ නිෂ්පාදනය කිරීම සඳහා අවශ්‍ය අමුද්‍රව්‍ය හිඟයකින් තොරව සපයා ගැනීමට වැඩපිළිවෙළක් තිබේද;

(v) එසේ නම්, එම වැඩපිළිවෙළ කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1539/2023

ගරු රාජිකා වික්‍රමසිංහ මහත්මිය,— කම්කරු හා විදේශ රැකියා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ගෘහසේවිකාවන් ලෙස වාර්ෂිකව විදේශ ගතවන ශ්‍රී ලාංකික කාන්තාවන් සංඛ්‍යාව එක් එක් දිස්ත්‍රික්කය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එසේ විදේශ ගතවීමේදී සේවා ගිවිසුම් අත්සන් කරන්නේද;

(iii) එසේ නම්, එම සේවා ගිවිසුමේ වලංගු කාලය කොපමණද;

(iv) ඉහත සඳහන් ගෘහසේවිකාවන් හා ඔවුන්ගේ පවුල් සම්බන්ධයෙන් ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය විසින් පසු විපරම් සිදු කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1575/2023

ගරු සංජීව එදිරිමාන්න මහතා,— විදුලිබල හා බලශක්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) හම්බන්තොට, පූනරින්, සියඹලාණ්ඩුව සහ ත්‍රිකුණාමලය සූර්යබල උද්‍යාන මේ වනවිට ස්ථාපනය කර තිබේද;

(ii) එසේ නම්, එම එක් එක් සූර්යබල උද්‍යානයෙන් ජාතික විදුලිබල පද්ධතියට ලබා දෙනු ලබන විදුලිය ඒකක ප්‍රමාණය මෙගාවොට්වලින් වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) ඉහත සඳහන් සූර්යබල උද්‍යාන මේ වනවිට ක්‍රියාත්මක කර නොමැති නම්, එම එක් එක් සූර්යබල උද්‍යානය ඉදිකිරීමේ ප්‍රගතිය වෙන් වෙන් වශයෙන් කවරේද;

(iv) එම එක් එක් සූර්යබල උද්‍යානයේ ඉදිකිරීම් කටයුතු අවසන් කරනු ලබන දිනය වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1616/2023

ගරු තිස්ස අත්තනායක මහතා,— පරිසර අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වර්ෂ 1996 දී අංක 947/13 දරන ගැසට් පත්‍රය මඟින් අභයභූමියක් ලෙස ප්‍රකාශයට පත් කර ඇති මුතුරාජවෙල අභයභූමියේ මායිම් මේ දක්වා සලකුණු කර නොමැති නම්, ඊට හේතු කවරේද;

(ii) ඉහත අභයභූමිය තුළ පවතින රජයේ හා පුද්ගලික ඉඩම් ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් හඳුනාගැනීමට මේ දක්වා ක්‍රියා කර නොමැති නම්, ඊට හේතු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) රජයේ සිතියම් අනුව හඳුනාගෙන ඇති සහ මධ්‍යම පරිසර අධිකාරිය විසින් හඳුනාගෙන ඇති ඉහත අභයභූමියට අයත් ඉඩම් ප්‍රමාණය හෙක්ටයාරවලින් වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) රජයේ සිතියම් අනුව හඳුනාගෙන ඇති ඉඩම් ප්‍රමාණය සහ මධ්‍යම පරිසර අධිකාරිය විසින් හඳුනාගෙන ඇති ඉඩම් ප්‍රමාණය අතර පරස්පරතාවයක් ඇති වීමට හේතු කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1630/2023

ගරු උපුල් මහේන්ද්‍ර රාජපක්ෂ මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ඉදිරියේදී ගුරු වෘත්තීය සඳහා උපාධිධාරීන් පමණක් බඳවාගැනීමට තීරණය කර තිබේද;

(ii) එසේ නම්, එම උපාධිධාරීන්ට ගුරු පුහුණුවක් ලබා දෙන්නේද;

(iii) එම උපාධිධාරීන් බඳවාගැනීමේදී ඔවුන්ගේ ඉංග්‍රීසි භාෂාව පිළිබඳ දැනුම, ක්‍රීඩා කුසලතා හා සෞන්දර්යාත්මක හැකියාවන් සම්බන්ධයෙන් සලකා බලන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) වෘත්තීය මූලික අධ්‍යාපන ක්‍රමයක් සඳහා විෂය නිර්දේශ සංශෝධනය කිරීමට පියවර ගන්නේද;

(ii) පාසල් සිසුන්ට වෘත්තීය පුහුණු අධ්‍යාපනය ලබා දීම සඳහා වෘත්තීය පුහුණු ගුරුවරුන් බඳවාගැනීමට කටයුතු කරන්නේද;

(iii) අධ්‍යාපන ප්‍රතිසංස්කරණ සම්බන්ධයෙන් මහජන අදහස් විමසීමට පියවර ගන්නේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1632/2023

ගරු ගුණතිලක රාජපක්ෂ මහතා,— ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) නාය යෑම් හේතුවෙන් උඩරට දුම්රිය මාර්ගයේ දුම්රිය ධාවනයට නිරන්තරයෙන් බාධා සිදු වන බවත්;

(ii) එමඟින් ඇති වන ප්‍රමාද වීම් හේතුවෙන් විදේශීය සංචාරකයන් හා දේශීය මගීන් යන දෙපාර්ශ්වයම අපහසුතාවයට පත්වන බවත්;

(iii) එම දුම්රිය මාර්ග ප්‍රතිසංස්කරණය කිරීම සඳහා යුද හමුදා භටයන් සහ දුම්රිය සේවකයන් යොදා ගැනීම කාර්යක්ෂම නොවන බවත්;

(iv) ලෝකයේ වෙනත් රටවල නවීන තාක්ෂණය භාවිතා කරමින් මෙවැනි කාර්යයන් සිදු කරනු ලබන බවත්;

එතුමා පිළිගන්නෙහිද?

(ආ) (i) ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුවේ ඉංජිනේරුවන්ගේ සහ තාක්ෂණ නිලධාරින්ගේ දැනුම උපයෝගී කර ගනිමින් දුම්රිය මාර්ගවල පස් ඉවත් කිරීම සඳහා බැකෝ යන්ත්‍රයක් නිර්මාණය කිරීමට පියවර ගන්නේද;

(ii) එසේ නම්, ඒ සම්බන්ධයෙන් ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1635/2023

ගරු මිලාන් ජයතිලක මහතා,— කම්කරු සහ විදේශ රැකියා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වර්ෂ 2020 සිට 2022.06.30 දින දක්වා කාලය තුළ විදේශ සේවා නියුක්ති කාර්යාංශය හරහා විදේශ රැකියා සඳහා යොමු කර ඇති ශ්‍රී ලාංකික ශ්‍රමිකයන් සංඛ්‍යාව එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එම ශ්‍රමිකයන් යොමුකර ඇති රටවල් කවරේද;

(iii) එම එක් එක් රට සඳහා යොමුකර ඇති ශ්‍රමිකයන් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) මේ වනවිට ශ්‍රී ලංකාවට ලැබී ඇති විදේශ රැකියා කෝටාව එක් එක් රට අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(v) රැකියා සඳහා විදේශගත වීමට අපේක්ෂාවෙන් සිටින ශ්‍රී ලාංකිකයන් සඳහා ක්‍රියාත්මකව පවතින භාෂා පුහුණු මධ්‍යස්ථාන සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1674/2023

ගරු චාල්ස් නිර්මලනාදන් මහතා,— සෞඛ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මන්නාරම් දිස්ත්‍රික්කයේ, මුරුංගන් රෝහල 2018 වර්ෂයේදී මූලික රෝහලක් ලෙස උත්ශ්‍රේණිගත කරන ලද නමුත්, මේ දක්වා ඊට සරිලන පරිදි එම රෝහලට අවශ්‍ය පහසුකම් සපයා නොමැති බව දන්නේද;

(ii) වෛද්‍යවරු ඇතුළුව එම රෝහල සඳහා අනුමත සේවක සංඛ්‍යාව සහ මේ වනවිට සේවය කරනු ලබන සේවකයන් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ඉහත රෝහලේ මෘත ශරීරාගාරයක් නොමැති වීම හේතුවෙන් මෘත ශරීර මන්නාරම මහ රෝහල වෙතට රැගෙන යාමට සිදු වීමෙන් මහජනතාව දැඩි දුෂ්කරතාවලට මුහුණ දී සිටින බව දන්නේද;

(ii) එසේ නම්, මුරුංගන් රෝහල සඳහා මෘත ශරීරාගාරයක් ඉදිකිරීමට කටයුතු කරන්නේද;

(iii) මුරුංගන් රෝහලේ සංවර්ධන කටයුතු ආරම්භ කරනු ලබන දින වකවානු කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1755/2023

ගරු සමන්ප්‍රිය හේරත් මහතා,— කර්මාන්ත අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) අත්යන්ත්‍ර රෙදිපිළි නිෂ්පාදනය කිරීම සඳහා භාවිතා කරනු ලබන යන්ත්‍ර ශ්‍රී ලංකාවේ නිෂ්පාදනය කරන්නේද;

(ii) නොඑසේ නම්, එම යන්ත්‍ර ආනයනය කරන්නේද;

(iii) 2015 වර්ෂයේ සිට මේ දක්වා ශ්‍රී ලංකාවේ නිෂ්පාදනය කරන ලද යන්ත්‍ර සංඛ්‍යාව කොපමණද;

(iv) අත්යන්ත්‍ර රෙදිපිළි නිෂ්පාදනය කිරීම සඳහා අවශ්‍ය අමුද්‍රව්‍ය ආනයනය කිරීමට වාර්ෂිකව වැය කරනු ලබන මුදල කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?